සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

| සිංහල II | 71 | S | II |
|---|---|---|---|

## II කොටස

මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න සතරකට පමණක් පිළිතුරු සපයන්න.

2.

අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

භරතමුනි සඳහන් කරන ආකාරයට අනුව අසාමාන්‍ය සංවාද හා අසාමාන්‍ය රඟුම්වලින් යුක්ත වූ ද, අසාමාන්‍ය චිත්ත වෘත්තීන් හා භාවයන් නිරූපණය කරන්නා වූ ද ලාලිත්‍යයෙන් යුතු අංගහාර හා අභිනයෙන් යුක්ත වූ ද, නාට්‍යමය ලක්ෂණයන්ගෙන් උපශෝභිත වූ ද, ස්වර හා අලංකාර සහිත වූ ද අස්වාභාවික ලෙස හැසිරෙන පාත්‍රයන් ඇසුරු කරන්නා වූ ද යම් නාට්‍යයක් වේ ද එය නාට්‍ය ධර්මී නාට්‍යයක් ලෙස හඳුන්වනු ලැබේ.

ලෝකයේ සිදුවන කිසියම් දෙයක් නළුවන් මගින් මූර්තිමත් ලෙස හා චිත්තාකර්ෂණීය ලෙස ඉදිරිපත් කරනු ලබන විට එය නාට්‍ය ධර්මී නාට්‍යයක් වන බව ඔහු පෙන්වා දෙයි. මූර්තිමත් ලෙස ඉදිරිපත් කිරීම යනු සංකල්පයක් හෝ වස්තුවක් නළුවන් මගින් දැක්වීමයි. මේ ආකාරයට සංස්කෘත නාට්‍යවල දී පර්වත, යානා, ගුවන් ගමන්, පලිහ, සන්නාහ, අයුධ, ධ්වජ ආදිය මූර්තිමත් ලෙස දක්වා තිබිණි. ළඟ සිට පැවසූ වදන් ඔවුනොවුන්ට නෑසීම, නොපැවසූ වදන් ඇසීම ආදිය ද නාට්‍ය ධර්මී ලක්ෂණ හැටියට භරත පෙන්වා දී තිබේ. නිමිත්තක් තිබීම, කවි සමය, සිහි නැතිවීම, රජු බිසව පාමුල වැඳ වැටීම ආදිය ද ලාලිත්‍යයෙන් යුතු අංග වින්‍යාසය හා වඩා එසවුණු පියවර තබමින් නැටීම ආදිය ද කක්ෂා විභාගය වැනි ලක්ෂණ ද නාට්‍ය ධර්මී ලක්ෂණ වශයෙන් සන්දර්ශිතය. කක්ෂා යනු කොටස් ය. මෙහි ද සිදුවන්නේ වේදිකාව මත එක විට දර්ශන කිහිපයක් රඟ දැක්වීමයි. මෙය සංස්කෘත නාට්‍යයට අනන්‍ය වූ ලක්ෂණයකි. මින් නාට්‍ය රසය තීව්‍ර ලෙස දැනවීමට ද අවස්ථාව සැලසේ. නිමිත්තක් හැඟවීම යනු යහපත් හෝ අයහපත් දෙයක් සිදුවීමට පෙරාතු ව සංකේතයක් ලෙස ඇස්, ඇහි බැම, තන මඩල, නළල, තොල්, කලවා ආදිය සලිත වන බව දැක්වීමයි. පිරිමි චරිතයක් නම් වම පස සලිත වීම, අයහපත්ව නිමිත්තක් ද දකුණු පස සලිත වීම යහපත් නිමිත්තක් ද වේ. ගැහැනු චරිතයක දී නම් වම යහපත් ද දකුණ අයහපත් ද වේ. මෙම නාට්‍යවල භයානක රසය වැනි රසයන්හි දී දෙබස් දැක්වීම අපහසු වන විට මූර්ඡා වීම යොදා ගනු ලැබේ. මෙය රූකඩ නාට්‍ය ආභාසයෙන් යොදා ගන්නා ලද බව ඇතැම් විචාරකයෝ පවසති.

1. භරතමුනි පවසන පරිදි නාට්‍ය ධර්මී නාට්‍යක් ලෙස හඳුන්වනු ලබන්නේ කිනම් නාට්‍යය ද?
2. ඔහු මූර්තිමත් ලෙස ඉදිරිපත් කිරීම යනුවෙන් දක්වා ඇත්තේ කුමක්ද?
3. සංස්කෘත නාට්‍යවල එලෙස මූර්තිමත් කරන්නේ මොනවාද?
4. කක්ෂා විභාගයෙන් සිදුවන්නේ කුමක් ද?
5. කක්ෂා විභාගය සංස්කෘත නාට්‍යයට අනන්‍ය වූවක් බව මින් ප්‍රකාශ වේ ද?
6. සංස්කෘත නාට්‍යවල භයානක රසය දැක්වීමට දෙබස් යෙදීම අපහසු විට ඊට පිළියමක් ලෙස කළේ කුමක්ද?

(ලකුණු 2X6=12)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

නිබෝයින් ම පණ පලායන උපදෙසක් දැයි භය ඇතියෙමි "යි කීය. ජීවකයෝ 'මා උපන් දවස් පටන් අද දක්වා ලෙහෙඩිල්ලකත් නොබින්දෙමි, මාගේ ප්‍රාණය නසත් නමුත් අනික් ප්‍රාණයක් නොනසමි. භය නොකොට කා බලගැ' යි කිහ. හෙතෙම ඒ ඇඹුලය අනුභව කොට අමාදියෙහි ගැලුවා සේ, ස්වප්නයෙන් දුටු දෙයක් සේ කිසි විඩාවකුත් නැතුව පැන නැගී සිනාසී "මට කිසි නුසුවයෙකුත් නැත ස්වාමීනි" යි කීය. එවෙලෙහි ජීවකයෝ 'තෝ මතු නොවෙයි. තාගේ රජ ද මෙතෙනට ගොඩ නැංගේම ය. අද පටන් ඔහට ද කිසිවක් ලෙඩ නැත.ඔහු කරා මම නොයෙමි. කිප දවසක් ගිය කල මාගේ අරුම තාගේ රජම දන්හි.

i. දාවායා ඉහත ප්‍රකාශය ජීවක වෙත කරන්නේ කුමන ඉරියව්වකින් සිට ද?
ii. හෙතෙම ජීවකගෙන් ඉල්ලා සිටින්නේ කුමක්ද?
iii. "ඔහු අස්වසා අනිත් ඇඹුල පකක් ගෙන අනික් නිය අගෙකින් ඖෂධයක් ඔබා" මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. "ලෙහෙඩිල්ලකත්" යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

ඉ) එවිට ස්ත්‍රිය කියන්නී "තොප කටින් ඩැ ගෙන ආ මාංශ කැටිය, මත්ස්‍යයා කමි' යි කටින් දමා මත්ස්‍යයා ඩැ ගන්ට ගිය කලට මාංශ කැටිය උකුසු ඩැ ගත. මත්ස්‍යයා දියට පැනපී ය. මේ කාරණය දැක සිනා සීමි" කිව. එවිට ශක්‍රයෝ කියන්නාහු "තොප මට සිනාසෙන්ට කාරණා කිම ද? තොපගේ පළමු පිසවා කැ සමුණනුත් නැති ව උභය භ්‍රෂ්ට ව ඉඳිනා තෙපි මට නින්දා කියා සිනාසෙන්නේය" යි ශක්‍රයෝ නින්දා කොට බිණුහ. ඊට ස්ත්‍රිය කියන්නී "පළමු මෙසේ වූ නොකොට යුත්ත කොට මෙසේ වූ දුකකට පැමිණිමි ඉනිබ්බෙ පතිව්‍රතා ධර්මය විනා මෙසේ වූ දෙයක් නො කරමි" කිව. ශක්‍රයෝත් 'පතිව්‍රතා ධර්මය විනා මෙසේ වූ නොකටයුත්තක් නොකරව' යි කියා අවවාද දී දෙව්ලොවට ගියාහ" යි වදාරා සර්වඥයන් වහන්සේ චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ චුල්ලධනුද්ධර ජාතකය නිමවා වදාළ සේක. චතුස්සත්‍ය දේශනාවගේ කෙළවර උකටලී භික්ෂූන් වහන්සේ සෝවාන් වූ සේක. ඒ සමයෙහි චුල්ලධනුද්ධරයෝ නම මේ භික්ෂූහු ය. ඒ සමයෙහි ස්ත්‍රී නම මේ ස්ත්‍රී ම ය. ඒ සමයෙහි ශක්‍ර ව උපන්නෙම් බුදු වූ මම්ම ය' තමන් වහන්සේ වදාළ සේක.

i. ස්ත්‍රිය සිනාසුනේ කුමන සිදුවීමක් දැක ද ?
ii. ස්ත්‍රියට ශක්‍රයා දුන් අවවාදය ඔබේ වචනයෙන් ලියන්න.
iii. "පළමු පිසවා කැ සමුණනුත් නැතිව අලුත් සමුණනුත් නැතිව උභය භ්‍රෂ්ට ව ඉඳිනා තෙපි" මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. "උකටලී භික්ෂුව" යන්න කෙටි විවරණ දක්වන්න.

(ලකුණු 04)

ඊ) එකෙණෙහි තමා පියාණන් පිටි පස්සෙහි හුන්නා වූ ස්වර්ණතිලකා තොම 'උද්දාල බ්‍රාහ්මණයාණෝ නම් කවුරුදැ' යි විචාරා "තෙල හද්‍ර පීඨය මත්තේ හිඳිනාහු ඒ බ්‍රාහ්මණයාණෝ යැ" යි කී කල්හි තමාගේ නිලුපුල් පෙති දෙකක් හා සමාන නිර්මල වූ සුනිල් නෙතින් ඔහු බලන්නී කොඳකැකුළු මෙන් සුදුසිනිඳු දත් පෙළෙහි මනහර සුදු රසින් භින්නවර්ණ වූ අතිරක්ත අධරයුග්මය පොපි දෙවා මඳ මඳ සිනා පහළ කෙරෙමින් උද්දාල බ්‍රාහ්මණයා මුහුණ බලා තමා පෙරවගෙන උන් පළස මඳක් පහකොට ශරීරප්‍රභා විහිදුවාලුව. හිරුරැස් කලඹක් වැනි ඒ ශරීරාලෝකය දැක උද්දාල බ්‍රාහ්මණයා ඉතා ආශ්චර්යමත් ව කවර ආලෝකයෙක් දෝ විස්මය පත් ව බලනුයේ ස්වර්ණතිලකාව දැක කාමයෙන් උමතු ව මහත් වූ ශෝකයෙන් දාහගත ශරීර ඇති ව හුණු වූ ආශ්වාස ප්‍රශ්වාසයෙන් පිරුණු මුඛ නාසිකා හා කඳුලු ධාරාවෙන් තෙත් වූ නේත්‍ර ඇතිව විසංඥ විය.

i. ස්වර්ණතිලකා රාජ සභාවට යනවිට උද්දාල සිටියේ කෙසේද?
ii. ස්වර්ණතිලකා විහිදු රශ්මි මාලාව උපමා කොට ඇත්තේ කුමකට ද?
iii. "සුදු රසින් භින්නවර්ණ වූ අතිරික්ත අධරයුග්මය පොපි දෙවා" මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. 'හද්‍රපීඨය' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

උ) සඳවා සුදු වැලි පිවිතුරු
බඳවා රන් දද පියකරු
සිටුවා දොර දොර රඹතුරු
තබවා පුන්කුඹු විසිතුරු

සුවඳ සඳුන් කොකුමහරා
පැහැද තමන් වෙර තවරා
නොමඳ සලෙළු දන එපුරා
නිබඳ කෙළිති සතොස පුරා

i. උදේනි පුරය සරසා ඇති අයුරු කෙසේ ද?
ii. සල්ලාල ජනයා සැණකෙළිය සඳහා සැරසුනේ කෙසේ ද?
iii. "පැහැද තමන් වෙර තවරා" යන උද්ධෘතය ලිඛිල් බසින් ලියන්න.
iv. 'පුන්කුඹු' යන්නට කෙටි විවරණ සපයන්න.

❖ ඌ සහ එ ප්‍රශ්න දෙකටම පිළිතුරු සපයන්න.

ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.
i. 'තොප කීවා සේ පෙනෙන හිර සඳ ඉල්ලව'
ii. 'මාගේ දිවි රැක දීලූයේ වී නම් මාගේ මෙ සියලු අසූ කෙළක් පමණ සිටු සැපතත් දෙමි.'
iii. 'තී හඬන්ට කාරණා කවරේ ද?'
iv. 'මෙ කුණු ශරීරයෙන් තොපගේ අමාත්‍යයාණන්ට ප්‍රයෝජන කිම ද?
v. "හම්මෙ - බලාපංකෝ උන්දේ, අව්වෙ තියෙන රස්නේ පුදුම පැවිල්ලක් තමයි !"
vi. ඔව්, මිනිස්සු කියනවා. මොනවටද ඉතින් උඹ බය?
vii. මා සමිඳුන් නැති අතරේ
කෙලෙස ද මා බැහැර යන්නේ ?

(ලකුණු 03X4 = 12)

එ) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂයෙහි සහ භාෂා ව්‍යවහාරයෙහි විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

දේදුන්න පායාවි හෙටත් පාලම උඩින්

නොවැලපෙමි ඔබ යන්න - වැලප ඇති පල කිම ද?
ජීවිතේ වැරදුණේ මෙතැන විතරක් නො වේ
සුරලා ගෙන යන්න මා හදේ පිපුණු මල්
මල් නහන වසන්තය ඔබට ගෙන යා හැකි ද?

'නොවැලපෙමි ඔබ යන්න - වැලප ඇති පල කිම ද?
ඔබේ හඬ අදින් පසු තවත් මට අයිති නැත
ඔබ නැත ද ජීවිතේ නසා ගත නොහැක මට
ඔබ යන්න ජීවිතේ සොයාගෙන සොයාගෙන'

ඔබ යන්න මධුරතර සප්ත ස්වරයත් අරන්
ඔබේ රථ මැදිරියට මගේ ඉර හඳ අරන්
ඔබ යන්න මහද තෙත් වැහි වලාකුළ අරන්
කමක් නෑ ඔබ යන්න - මගේ ආයුස අරන්

දේදුන්න පායාවි හෙටත් පාලම උඩින්
ඔබ නැතත් - මම එතැන පාට හත ගණින්නම්
ඔබ යන්න හැරී නොබලා ඔබේ කිරුළ ගෙන
පරාජිත කඳුළකට ඇසේ ඉඩ තියා නැත



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

වෙස් මුහුණු පැලඳගෙන සිටින තැන හිතක් නැත
ගෙවදින්න ඇති නිසා හෙට අලුත් විමානෙට
පෙම් ගී අලංකාර වීසි කොට යනු මැනවි
නිල් ගුවන් ගැබ වදින කුරුල්ලෙකු පරිද්දෙන්
ඔබ ඔබේ සිහිනයට - මම මගේ ලෝකයට

හෙමෙන් මා අත අතැර- දෙපස හෙවණැලි අතර
ඔබ සෙමෙන් හැංගුණේ, එය වඩා විනීත යි
එදා ඔබ ගෙයි මුල්ලෙ - සොයාගත් මං දිනුම්
ඔබ සැඟව ගියෙ කොයි ද - සොයන්නේ නෑ ඉතින්
ජය පරජය කවුද - මට එයින් පලක් නැත

ආදරය නින්දක් ද - පිබිදිලා සිටින මට
දිනෙන් දින මගේ නෙත් පැහැදුල් ය. සුවිපුල් ය
නින්ද තුළ නැති වුණේ එක් දෙයයි - වරදක් ද?
තව බොහෝ දේ තිබේ - ජීවිතේ ජය ගනිමි.

(ලකුණු 12)

2) පුද්ගල සන්තානයේ ඇති විවිධ දුබලතා ප්‍රබලතා කතා රසය හා මුසු කරමින් නිරූපණය කර ඇති අයුරු සද්ධර්මරත්නාවලියේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයකි. අදාළ කතා වස්තු ඇසුරෙන් නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

නැතහොත්

ජාතක කතාකරු මිනිස් සිතේ සියුම් මනෝභාවයන් සාහිත්‍ය රසයෙන් යුතුව ඉදිරිපත් කරයි. නියමිත කතා ආශ්‍රයෙන් විමසන්න.

(ලකුණු 15)

3) රසවත් කතා වස්තු මුල් කරගනිමින් මානවයාගේ පැවැත්ම ස්ථාවර කර ගැනීමට අවශ්‍ය ගුණ දහම් මිනිස් සිතේ පෝෂණය කිරීම සද්ධර්මාලංකාර කතුවරයාගේ අභිප්‍රායයි. ස්වර්ණතිලකා වස්තුව හා නන්දිවාණිජ වස්තුව ඇසුරෙන් නිදසුන් දක්වමින් මේ අදහස විමසන්න.

(ලකුණු 15)

නැතහොත්

දැඩි චිත්ත ශක්තියෙන් අරමුණු ජයගත හැකි බව පසක් කිරීම පූජාවලියේ ඇතැම් කතා වස්තු තුළින් විද්‍යමාන වේ. අනුරුද්ධ කුමාර කථාව හා ජීවක වෛද්‍යවරයාගේ කථාව ඇසුරු කර ගෙන නිදසුන් දෙමින් පිරික්සන්න.

(ලකුණු 15)

4) (අ) "කෝට්ටේ අවධිය පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගයයි" නිදසුන් දෙමින් විමර්ශනය කරන්න. (ලකුණු 07)
(ආ) මිනිස් හැසිරීම සජීවීව විරාජමාන කරමින් සැණකෙළියක අසිරිය චිත්තරූප ජනනය වන අයුරින් නිරූපණය කිරීමට කතුවරයා පෑ සාමර්ථ්‍යය සැණකෙළි වැනුම ඇසුරෙන් සාකච්ඡා කරන්න.. (ලකුණු 08)

5) බෙදනීය ඉරණමකට මුහුණ දෙන ගම්මානයක් ඇසුරු කරගත් යථාර්ථවාදී නවකතාවක් වන "බැද්දේගම" වඩාත් පාඨක විශ්වසනීයත්වයට පත් වන්නේ කතුවරයා විසින් උපයුක්ත භාෂා ප්‍රවීණත්වය නිසයි. නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

6) 'මානව දයාවෙන් තොර වූ මිනිසුන්ගේ ක්‍රියා කලාපයන් දෙස පිළිකුල්ව බලන සංවේදී මිනිසෙකු නිර්මාණය කිරීම කෙටි කතාකරුවාගේ අභිප්‍රායයි.' කරත්තය, කළු සපත්තු, කවියෙකුට අත්දැකීමක් කෙටි කතා ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub
CamScanner

7) නූතන කවීන්ගේ කාව්‍යකරණයේ විශේෂතා, වස්තු විෂය, කාව්‍ය භාෂාව හා කාව්‍යෝක්ති භාවිතය නියමිත පද්‍ය පන්ති තුනක්වත් ඇසුරෙන් පහදන්න. (ලකුණු 15)

8) ශිල්ප බලයෙන් යටපත් කළ මිනිස් හැඟීම් ඉස්මතු වී ලෝක යථාර්ථයට මුහුණ දෙන මිනිස් චරිතයක් උද්දාල බ්‍රාහ්මණයා තුළින් නිරූපණය වේ. එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ "පෙමතො ජායතී සොකො" නාට්‍ය ඇසුරින් මේ ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

***

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සාහිත්‍ය කෘතිවලට කාලීන සමාජ අර්ථයක් මූලභූත වන නිසාත්, සාහිත්‍ය කෘතිවල රචනෝපක්‍රම සමාජ ලක්ෂණයන්ට අනුරූප ව සකස් වන නිසාත්, සාහිත්‍ය නිර්මාණයක අගය හා වැදගත්කම එය සම්පාදිත වූ යුගයට හා සමාජයට සීමා නොවන්නේදැ' යි කෙනෙකුට මෙහි දී ප්‍රශ්නයක් මතු කළ හැකි ය. එහෙත් කවර උසස් සාහිත්‍ය කෘතියක වුව ද ද්විත්ව ලක්ෂණ විද්‍යමාන වේ. එක් අතකින් එම රචනය ලියැවුණු යුගයට හා සමාජයට විශේෂ වූ ලක්ෂණ එහි දක්නට ලැබේ. අනෙක් අතින් දේශයේත්, කාලයේත් සීමාවලින් විනිර්මුක්ත වූ සාර්වත්‍රික වූත් සර්වකාලීන ලක්ෂණ එහි දක්නට ලැබේ. ඇත්ත වශයෙන් කවර සාහිත්‍ය නිර්මාණයක වුව ද වැදගත්කම කෘතියෙන් නැගෙන පොදු ධ්වනියයි. බොහෝ විට එය මනුෂ්‍ය ස්වභාවය හා ජීවිතය සම්බන්ධ සනාතන අර්ථයකින් හෙබි විග්‍රහයක් වන්නේ ය. සාහිත්‍ය කෘතීන්හි මේ විශ්වව්‍යාප්ති ස්වභාවය විද්‍යමාන නොවේ නම් නවකතාකරුවන්ගේ නිර්මාණයන් කුමට කියවමු ද? අපට ඒවායින් රසයක් හා අරුතක් උකහා ගැනීමට පිළිවන් වන්නේ කෙසේ ද?
කවර භාෂාවෙන් රචිත වුව ද, කවර දේශයකට අයත් වුව ද, උසස් සාහිත්‍ය නිර්මාණය මිනිසා සතු පොදු වස්තුවක් බවට පත්වන්නේ මේ ධ්වනිතාර්ථය නිසා ය. එහෙත් එම ධ්වනිතාර්ථය උලුප්පා දැක්වීමට කාලීන, දේශීය ලක්ෂණ අත්‍යන්තයෙන් වැදගත් වේ. ඒ ඒ සමාජවල පවත්නා සිරිත් විරිත්, පුද පූජා, ඇදහිලි විශ්වාසාදිය සාහිත්‍ය කෘතියකට ජීවමාන විලාසයක් ආරූඪ කරවීමටත් පාඨකයාගේ විශ්වාසය දිනා ගැනීමටත් බෙහෙවින් අවශ්‍ය වේ.

(ලකුණු 13)

3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.
   1. දිට්වා සුළි කුණාටුවෙන් පසු යළි පිබිදෙන ශ්‍රී ලංකා
   2. ලෝක බලවතුන්ගේ ක්‍රියා කලාපය හමුවේ සැලෙන ලෝක සාමය
   3. ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කරමු
   4. බල ශක්ති අර්බුදය හා පුනර්ජනනීය බල ශක්තිය
   5. මානසික ආතතියට පිළියමක් ලෙස කලාව

(ලකුණු 25)

4.

අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

1. විනිසුරුවරයන් සියල්ලෝ ම ඒකමතික තීරණයක විසූහ.
2. ප්‍රවීණ කලාකරුවෙක් වූ සංජීව රංගධර මහතා දැයෙන් සමුගත්තේය.
3. පදිකයෝ මාර්ග නීති කඩ කළහ'යි රියදුරෝ පවසති.
4. ලෝක සාමය උදා වෙත්වා !
5. ගංගා තොමෝ නිසල ව ගලා බසින්නී ය.

ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.
1. ජනපති අමාත්‍යවරුන් කැඳවූයේ ය.
2. වැත්තැවේ හිමියෝ ගුත්තිල කාව්‍ය රචනා කළහ.
3. මගීහු ආපනශාලාවේදී තොප ඇමතූහ.
4. ඇමතිතුමා කලාකරුවන් පසසයි.
5. පැණි කුරුල්ලෙක් කුඩා ජම්බු ගසක කූඩුවක් තනයි.

ඇ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.
1. (දරුවන්/දරුවෝ) මෙන් වැඩිහිටියෝද නියඟයෙන් පීඩා විඳිති.
2. සල්, නා, දොඹ, හෝපලු ගස් පෙළ නගරයට සෙවණ (සදයි / සදති)
3. කළමනාකරු (සේවකයෝ / සේවකයන්) ලවා නගරය ආරක්ෂා කළහ.
4. ගගනගාමීහු (සිව් දෙනෙක් / සිව් දෙනෙකු) සඳ තරණය කළහ.
5. විදුහල්පතිතුමා නොහොත් නියෝජ්‍ය විදුහල්පතිතුමිය ශිෂ්‍ය සභාව (අමතන්නේය / අමතන්නීය / අමතති)

(ලකුණු 5 X 3=15)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

5. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

1. **උදාරතර රණවිරුවෝ අභිමානයෙන්** පෙරට ම යති.
(උදාරතර - තද්ධිත, රණවිරුවෝ - සමාස, අභිමානයෙන් - විභක්ති)

2. වැසි **තත්ත්වය** යම් තරමකින් අඩු වුව **ද මුහුදුරළ** චණ්ඩ වීම අඩු නොවනු ඇත.
(තත්ත්වය - තද්ධිත, ද - නිපාත, මුහුදුරළ - සමාස)

3. **බුත්සරණ වැනි** සම්භාව්‍ය ගද්‍ය කෘති **සම්පාදනය** පොළොන්නරු යුගයේ දී දක්නට ලැබුණි.
(බුත්සරණ - සන්ධි, වැනි - නිපාත, සම්පාදනය - උපසර්ග)

4. **ගගනගාමීන්** සඳ වෙත පියාසර **කරද්දී** මැද පෙරදිග යුද ගිනි **දැල්වෙනු** ඇත.
(ගගනගාමීන් - තද්ධිත, කරද්දී - ක්‍රියා, දැල්වෙනු - කෘදන්ත)

5. **යාවජීව** සාමාජිකයෝ සිය ව්‍යවස්ථාව **ආධුනිකයින්ට හඳුන්වා** දුන්හ.
(යාවජීව - සමාස, ආධුනිකයින්ට - විභක්ති, හඳුන්වා - ක්‍රියා)

6.

අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

1. යම්කිසි නිර්මාණයකින් ඉස්මතු කෙරෙන ලේඛකයකුගේ ........................හඳුනාගැනීමට ප්‍රයෝග ඇත.
2. අදහස් ප්‍රකාශ කිරීමේ දී හා හැඟීම් දැනවීමේ දී ................................ බස්වහර අතිශයින් වැදගත් වේ.
3. නව ප්‍රබන්ධයක සත්‍යතාව ඇති වන්නේ එහි .................................... විෂය කරුණු නිසා ය.
4. මෙරට ශාස්ත්‍රීය ..............................ඇති වීමට බල පෑ හේතු රැසකි.
5. පැරණි කතා කලාවේ ක්‍රමානුකූල .................................ප්‍රතිඵලයක් ලෙස සිංහල නවකතාව ප්‍රභවය වූ කලා මාධ්‍යයකි.
6. ............................ නවකතා පෙළෙහි අවසාන කෘතිය යුගාන්තය වේ.

(සංගෘහිත, තුන් ඈඳුතු, ජීවන දෘෂ්ටිය, විකාශනයේ, උපයුක්ත, පුනර්ජීවනයක් )

(ලකුණු 1/2X6=03)

ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

| | | |
|---|---|---|
| 1. ගිනි + කම | 2. අඹ + පාර | 3. නි + අවුල් |
| 4. දකුණු + අත | 5. රත්මල් + ආන | 6. උකුසු + ආ |

(ලකුණු 1/2X6=03)

ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

1. අපි **ශ්‍රී ලංකාවෙන්** පිට වී ගියෙමු.
2. **වෛද්‍යවරුන් විසින්** වැඩ වර්ජනය නිමා කරන ලදී.
3. **දුදනන්** විලස නොහැසිරෙව්.
4. **ලෝක බලවතුන්ගේ** ක්‍රියා කලාපයෙන් බොහෝ රටවල් පීඩාවට පත් වේ.
5. **ඉදිරියටම** යව් **හෙළයනි**, ඉදිරියටම යව්
6. සද්ජනයන් විසින් අභිංසක **සත්තු** බේරාගන්නා ලදහ.

(ලකුණු 1/2X6=03)

ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

1. අහෝ ඔබ වහන්සේට මේ කිමෙක් වී ද
2. කුඩ කොඩි සේසත් දවුල් හොරණෑ සහිත පෙරහැර දේවාල පෙරහැර ලෙස හැඳින්වෙයි
3. රංබරණා වික්ෂිප්තව කම්පා වෙමින් ඒ වුණාට හේතුවෝ මං උඹට උගන්නනවනේ

(ලකුණු 1/2X6=03)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CS CamScanner

උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

1. 'අපි හඳට ඉතා ආසන්නයෙන් ගමන් කරනවා' අභ්‍යවකාශගාමීහු පැවසූහ.
2. දරුවනි, නුඹලා විභාගයට ඉදිරිපත් වන්නේ ද? යි ගුරුතුමා විමසුවේ ය.
3. "මම හරි වාසනාවන්තයෙක්" යි හෙතෙම ප්‍රීතියෙන් කීවේය.

(ලකුණු 1X3 = 03)

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගැඹුරින් විමසන විට නාට්‍ය රචනය සාහිත්‍යමය ක්‍රියාවලියක් වුවත් නාට්‍ය රචකයා සාහිත්‍ය කරුවෙකු මෙන් ම නාට්‍යකරුවෙක් ද වේ. ඔහු පිටපත රචනා කරන්නේ කියවීමට පමණක් නො ව **රඟපෑමට** ද සමහ ය. එය මේසය මත තබා ලියුව ද කරලිය මත ප්‍රාසාංගිකව සජීවීව මැවීමටත් හැකියාව තිබිය යුතුය. 'නාට්‍ය ය මුලින්ම රංගගත වන්නේ රචකයාගේ **මනස්** කරලියේ ය'. යන කියමන ගොඩ නැගී ඇත්තේ ඒ නිසා ය. නාට්‍යයක් රචනා කිරීමට අත්දැකීමක් පාදක විය යුතු ය. එය තම අත්දැකීමක් හෝ **උපකල්පනය** කරනු ලැබූ අත්දැකීමක් විය යුතු ය. ගොඩනැගිල්ලක් තැනීමට වාස්තු **විද්‍යාඥයකු** උපදෙස් දෙන්නේ ගෘහනිර්මාණ ශිල්පියා විසින් නිර්මාණය කරනු ලැබූ ගෘහ නිර්මාණ සැලසුමට අනුව ය. එලෙස නාට්‍ය අධ්‍යක්ෂවරයා නාට්‍ය නිෂ්පාදනය කිරීමට උපයෝගී කර ගන්නේ රචකයා විධිමත්ව **පිළියෙල** කළ නාට්‍ය පිටපත යි. නාට්‍යයේ පෙළට පාදක වන්නේ යම් කතා පුවතකි. සංස්කෘත නාට්‍යයේ දී ඉතිවෘත්තය ලෙස හඳුන්වා ඇත්තේ මේ කතා පුවත යි.

1. ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් පෙළ ගස්වා ලියන්න.
2. සාහිත්‍යකරුවකු, ගෘහ නිර්මාණ, ගොඩනැගිල්ලක් යන වචනවල යෙදී ඇති පිලි හඳුන්වන්න.
3. මෙම ඡේදයේ ඇතුළත් තද්ධිත පද 3ක් උපුටා ලියන්න.
4. රකාරාංශය හා ඇලපිල්ල, අනුස්වාරය, ඉස්පිල්ල යන පිල්ලම් හා දන්තෞෂ්ඨජ අක්ෂරයක් යෙදී ඇති වචනයක් සොයා ලියන්න.
5. ක්‍රියාවලියක්, ගොඩනැගිල්ලක්, අධ්‍යක්ෂ යන වචන විසන්ධි කොට දක්වන්න.

(ලකුණු 3X5 = 15)

8. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා කෙටි සටහන් ලියන්න.
1. වර්ගාක්ෂර
2. මිශ්‍ර ක්‍රියා
3. විභක්ති සමාසය
4. ගාත්‍රාදේශ සන්ධිය
5. කරණකාරක කෘදන්ත

(ලකුණු 5X3 = 15)

***

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

| සිංහල II | 71 S II | 13 ශ්‍රේණිය | පැය තුනයි |
|---|---|---|---|

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:

- I කොටසේ I ප්‍රශ්නය ද II කොටසේ 2,3 ප්‍රශ්නය ද ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුරු තෝරාගෙන, එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1. සිංහල අක්ෂර මාලාවෙහි එන 'ව' යන්න කවර ගණයකට අයත් අක්ෂරයක් ද?
1. ඝෝෂ දන්තෞෂ්ඨජ
2. ඝෝෂ ඕෂ්ඨජ
3. අඝෝෂ කණ්ඨෞෂ්ඨජ
4. අඝෝෂ දන්තෞෂ්ඨජ
5. ඝෝෂ මූර්ධජ අර්ධ ස්වර (........)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
1. ආපනශාලා, දැළිපිහිය, කොට්ඨාසය, ප්‍රභාසංශ්ලේෂණ
2. ආපණශාලා, දැලිපිහිය, කොට්ඨාසය, ප්‍රභාසංශ්ලේෂණ
3. ආපණශාලා, දැළි පිහිය, කොට්ඨාසය, ප්‍රභාසංශ්ලේෂණ
4. ආපණ ශාලා, දැලිපිහිය, කොට්ඨාශය, ප්‍රභාසංස්ලේෂණ
5. ආපනශාලා, දැලිපිහිය, කොට්ඨාසය, ප්‍රභාසංස්ලේෂණ (........)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
1. අමාවතුරු, කව්සිළුමිණ, මුවදෙව්දාවත, ධර්ම ප්‍රදීපිකාව, බුත්සරණ
2. අමාවතුරු, කව්සිළුමිණ, බුත්සරණ, ධර්ම ප්‍රදීපිකාව, මුව දෙව්දාවත
3. කව් සිළුමිණ, මුව දෙව්දාවත, ධර්ම ප්‍රදීපිකාව, අමාවතුර, බුත්සරණ
4. කව් සිළුමිණ, අමාවතුර, බුත්සරණ, ධර්ම ප්‍රදීපිකාව, මුව දෙව්දාවත
5. අමාවතුර, කව්සිළුමිණ, ධර්ම ප්‍රදීපිකාව, බුත්සරණ, මුව දෙව්දාවත (........)

1.4 පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. යංශය සමඟ වෙනත් පිල්ලම් නොයෙදේ.
2. වචනයක ආරම්භයේ යංශය යෙදේ.
3. රේඵය යෙදෙන්නේ ගාත්‍රාක්ෂරයක පාදාන්තයේ ය.
4. මූර්ධජ " ළ" හල් ව යෙදේ.
5. යංශය හා බැඳෙන ගාත්‍රාක්ෂරය සමඟ හල් පිල්ලම නොයෙ දේ. (........)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

1.5 එකිනෙකට අනුරූප වන සේ යෙදුණු වචන යුගල සහිත වරණය තෝරන්න.
1. අඹු දරුවෝ, ඇත් පවුර, අලුත් නගරය, විද්‍යා පිබිදුම
2. තෘණ පඳුරු, අහස් මන්දිරය, කැලණි ගංගාව, ගංවතුර
3. අඹ යහළුවා, උතුරු සළුව, අහස් ගංගාව, ආචාර සමාචාර
4. ග්‍රහචාරය, ක්‍රියා විවරණය, කඳු වැටිය, ඇසළ පෙරහැර
5. දිය කෙළිය, ස්වර සංකේත, වෙද මන්දිරය, උයන් ක්‍රීඩා

(........)

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක්ද?
1. අභියාචනය, වලාකුළු, ජලය, වාතය
2. විද්‍යුතය, මූෂිකා, බාලිකා, වැසි
3. පුෂ්ප, යක්ෂ, ශීත, අහ
4. අක්ෂර, ව්‍යවහාර, උත්තර,සමාචාර
5. වර්ණ, කර්ණ, දරන, බලන

(........)

1.7 තත්භව වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
1. හෙරළි, වටිනා, දේශනා, ප්‍රවීණ
2. කුසල්, මඟුල්, තැපැල්, කැලැල්
3. පෝෂණ, මහන, මුද්‍රන, සදන
4. ගමන, ඇසෙන, ප්‍රාණ, ප්‍රවීණ
5. ගත්, දත්, නෙත්, පිත්

(........)

1.8 අධාර, අවධි, සම්බන්ධ හා සම්ප්‍රදාන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.
1. තැඹිලිතෙල්, සොරබිය, සුරසතුරු, දේවපූජා
2. පොල්තෙල්, මුහුදු සුළං, හිරුකිරණ, ළමාගී
3. මිහිදුම්, ගුරු උපහාර, බඹදත්, රිදී හවඩි
4. අත්කම්, දෙව්දත්, සඳ රැස්, මව්පිය උපස්ථාන
5. වනමල්, වෙඩුඹස්, රන් කරල්, පින්හාල්

(........)

1.9 කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
1. හැඩුම, දෙඩුම, සැනසුම, විමසුම
2. කැපිලි, කෙටිලි, නැටිලි, සෙවිලි
3. ඉල්ලුම, සැපයුම, සෙවුම, රැවුම
4. ඉල්ලන, ලියන, අඳින, දුවන
5. වසනා, වාසනා, නසනා, ගසනා

(........)

1.10 පහත දැක්වෙන උද්ධෘතවල තද ඉරි ඇඳි පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
- නටත ඇතමෙක් තුටින් ගී ගයා
- සමුදුර කලඹ කලඹා රුදුරු ගිනි මවන්නිය
- අධ්‍යක්ෂවරයා නාට්‍ය රචකයා ලවා නාට්‍ය පිටපත ලියවයි.
- ඔහු සිය බුද්ධිය මෙහෙයවා ලොව ජය ගත්තේ ය.

1. අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියා
2. අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා
3. අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා
4. විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
5. අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

(........)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
1. නූතන, රුසියානු, රාෂ්ට්‍රීය, ප්‍රාථමික
2. ඔබ, මොබ, මුහුළස්, පැනිති
3. පුතණු, තුරුණු, මයිලණු, රාජකීය
4. සිරිමත්, රූමත්, ගිමත්, ගුණවත්
5. නිර්වාණගාමී, විහාරවාසී, දිළිඳුකම, ජෝෂ්ඨ

(........)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

1.12 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.
1. අදියර, සාතිශය, ප්‍රත්‍යක්ෂ, පිරිවර
2. පසිඳු, පසක්, අපනයන, පිරිසඳ
3. ඉමහත්, පරිහීන, අනේවාසික, නිග්‍රහ
4. සුගන්ධ, අබිසෙස්, දුබල, නොසැලකිල්ල
5. අනුචිත, පරාක්‍රම, අතිගරු, සංකල්පනා (........)

1.13 නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
1. විනා, විස, මුත්, ඇයි
2. පටන්, දක්වා, අදර, විසින්
3. නිසා, ගේ, කරණ කොට, හෙවත්
4. අනේ, එම්බල, වනාහි, ම
5. ඔව්, නෑ, බෑ, හරි (........)

1.14 විශ්ව විද්‍යාල <u>මහාචාර්යතුමාගේ</u> දේශනයට සවන් දුන් <u>ජනතාව</u> සිය <u>දුර්මත</u> ඉවත දැමූහ. මෙහි ඉරි ඇඳි පදවල ඇති ව්‍යාකරණ වර්ගය නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.
1. අව්‍ය පද, ප්‍රත්‍යයාර්ථ නාම, සමාස
2. සන්ධි, ප්‍රත්‍යයාර්ථ නාම, අව්‍ය පද
3. සමාස, ප්‍රත්‍යයාර්ථ නාම, අව්‍ය පද
4. ප්‍රත්‍යයාර්ථ නාම, සමාස, අව්‍ය පද
5. සන්ධි, අව්‍ය පද, ප්‍රත්‍යයාර්ථ නාම (........)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.
1. විමසත, කියත, බැලුවොත්, සෙව්වොත්
2. ලියයි, නටවයි, කරයි, බබළයි
3. කා, ගොස්, කරව, ගයා
4. වයමින්, කකා, බලා, විමසමින්
5. ලැබුණු, පිසුණු, ගනු, ඉපදුණු (........)

1.16 සමාසයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
1. දහ අට වංගුව, දසසිල්, මැටි බඳුන්, තිනෙත්
2. සුචරිත, අසුර, මෙහෙකරු, ඇද්දළ
3. සුරලොව, දිව්හම්, මුහුදු ලුණු, රටවැසි
4. රටවැසි, රජබිය, උපහාර, සඳවත
5. රන්මුවා, මල්කම්, කම්කරු, නයිවිස (........)

1.17 එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.
1. කිරිමැටියාන, නිරපරාධ, වමත, ගෙවුයන්
2. ග්‍රාමෝදය, පිළියම්, දූර්වල, පන්සිය
3. අත්‍යවශ්‍ය, අන්වර්ථ, අත්‍යුත්කෘෂ්ට, අන්වීක්ෂය
4. මනැසින්, හිඟුරල, ගංවතුර, විදුරසුන
5. ඇත්තු, උකුස්සා, දෙවුර, ඉදියාප්ප (........)

1.18 ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න.
1. රඹුක්කන, එක්ටැම්ගේ, පුවත්පත්, පිරියක්
2. සරාසඳ, නෙරළුතෙල්, අතැවැසි, උරදා
3. නෑ, ගෑ, පෑ, කෑ
4. කලාගාර, ධර්මිෂ්ඨ, මුද්‍රණාල, පූජාවලි
5. එම්බල, නිති, ඉක්බිති, ඉතින් (........)

1.19 ව්‍යාකරණානුකූලව නිරවද්‍ය වාක්‍ය තෝරන්න.
1. නටත්, ගයත්, ඇතැමෙකු රිසි සේම.
2. ඇ දෙවඟනක් සේ සැරසී සිටියා ය.
3. සියලු සත්ත්වයන් යහපත් සිතිවිලි ඇත්තෝ වෙත් වා !
4. මා සත්‍ය පවසති ’යි ඔවුහු සිතූහ.
5. ගංගා තොමෝ මහෝඝයක් වී ගලා බසිති. (........)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍ය සහිත වරණය තෝරන්න.
1. ඔබ එච්චර සිතිය යුත්තක් ද?
2. අපි එම අවස්ථාවේ ප්‍රධාන දොරටුව අබියසට පැමිණියෙමු.
3. එයිලා ආහම ඔයත් එන්න.
4. දොඩව දොඩව නො ඉඳ වැඩක් කරන්න.
5. මාත් එක්ක ආවොත් මා එය ඉටු කරමි (........)

(ලකුණු 1×20=20



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

# පෙරහුරු පරීක්ෂණය - 2026

## 13 ශ්‍රේණිය

## ii ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු පත්‍රය.

| | | | |
|---|---|---|---|
| 1 | 1 | 11 | 3 |
| 2 | 3 | 12 | 4 |
| 3 | 2 | 13 | 2 |
| 4 | 5 | 14 | 2 |
| 5 | 4 | 15 | 1 |
| 6 | 4 | 16 | 5 |
| 7 | 2 | 17 | 3 |
| 8 | 2 | 18 | 1 |
| 9 | 5 | 19 | 4 |
| 10 | 3 | 20 | 2 |

2) 1.

* අසාමාන්‍ය සංවාද හා අසාමාන්‍ය රැඟුම්වලින් යුක්ත වීම.
* අසාමාන්‍ය චිත්ත වෘත්තීන් හා භාවයන් නිරූපණය
* ලාලිත්‍යයෙන් යුතු අංගහාර හා අභිනයෙන් යුක්ත වූ නාට්‍යමය ලක්ෂණයන්ගෙන් අලංකාර වීම, ස්වර හා අලංකාර සහිත වීම.
* අංශෝභන ලෙස හැසිරෙන පාත්‍රයන් ඇසුරු කරන නාට්‍යයයි.

2. සංකල්පයක් හෝ වස්තුවක් නළුවන් මඟින් දැක්වීමයි.
3. පර්වත, යානා, ගුවන්ගමන්, පලිහ, සන්නාහ, ආයුධ, ධ්වජ
   (සියලු කරුණු ඇතුළත් නොවන විට එක් ලකුණක් පමණක් දෙන්න)
4. වේදිකාව මත එකවිට දර්ශන කිහිපයක් රඟ දැක්වීම.
5. ඔව්.
6. අදාළ චරිතය ඔහි මූර්ජා වීම.

2) ආ) සාරාංශය

නියමිත වචන ප්‍රමාණය - ලකුණු 02

අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ - ලකුණු 03

අන්තර්ගතය - ලකුණු 08

(වචන 70 - 80 අතර)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

* සාහිත්‍ය නිර්මාණයක අගය හා වැදගත්කම සම්පාදිත යුගයට හා සමාජයට සීමා නොවන්නේ දැ'යි ඇසීමට එහි විද්‍යමාන ද්විත්ව ලක්ෂණ විශේෂිත වේ.

* කවර සාහිත්‍ය නිර්මාණයක වුව ද වැදගත්කම රඳාපවතින්නේ විශ්ව සාධාරණ ලක්ෂණ මතයි.

* එය ධ්වනිතාර්ථයයි.

* එය මනුෂ්‍යත්වය හා ජීවිතය සම්බන්ධ විග්‍රහයකි.

* සාහිත්‍ය කෘතියක විශ්ව ව්‍යාප්ති ස්වභාවය නැතිනම් එය රස විඳිය නොහැක.

* කවර භාෂාවකින්, කවර දේශයක රචනා වුවත් උසස් සාහිත්‍ය නිර්මාණ පොදු වස්තුවක් වන්නේ ධ්වනිතාර්ථ නිසයි.

* එම ධ්වනිතාර්ථය ඉස් මතු කිරීමට කාලීන, දේශීය ලක්ෂණ අවශ්‍ය වේ.

* එම දේශීය සිරිත් විරිත් පුද පූජා, ඇදහිලි විශ්වාස නිසා සාහිත්‍ය කෘතියකට ජීවමාන විලාසයක් ආරූඪ වේ.

3) රචනාව

රචනය සඳහා ලකුණු දීමේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

i. තෝරාගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය.

ii. එම කරුණු සංවිධානාත්මකව ඉදිරිපත් කිරීම

iii. කරුණුවල පැහැදිලි බව.

iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය.

v. ව්‍යාකරණ දෝෂ රහිත වීම.

vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම.

vii. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම.

viii. අත් අකුරු පැහැදිලි වීම. (ලකුණු 25)

4) (අ) i. විනිසුරුවරයෝ/ විනිසුරුවරු සියල්ලෝම ඒකමතික තීරණයක විසූහ.

ii. ප්‍රවීණ කලාකරුවෙකු වූ සංජීව රංගධර මහතා දැයෙන් සමු ගත්තේ ය.

iii. පදිකයන් මාර්ග නීති කඩ කළහ'යි රියදුරෝ පවසති.

iv. ලෝක සාමය උදා වේවා !

v. ගංගා තොමෝ හිසලව ගලා බසින්නීය. (ලකුණු 5)

(ආ) 1. ජනපති විසින් අමාත්‍යවරු කැඳවූණාහ /කැඳවනු ලැබූහ/ලදහ.

2. වෑත්තෑවේ හිමියන් විසින් ගුත්තිල කාව්‍ය රචනා කරන ලදී/රචනා කෙරිණි.

3. මගීන් විසින් ආපන ශාලාවේදී තොපි ඇමතුණෝහු /ඇමතනු ලැබුවෙහු.

4. ඇමතිතුමා විසින් කලාකරුවෝ පැසසෙති/ පසසනු ලබති.

5. පැණි කුරුල්ලෙකු විසින් කුඩා ජම්බු ගසක කූඩුවක් තැනේ/ තනනු ලැබේ/ ලබයි.

(ලකුණු 5)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

ඈ) 1. දරුවන් 2. අඳයි
3. සේවකයන් 4. සිව් දෙනෙක් 5. අමනාපනීය (ලකුණු 5)

5) 1) උදාරතර - තද්ධිත - අතිශයාර්ථය තද්ධිත
රණවිරුවෝ - සමාස - විශේෂණ සමාස
අභිමානයෙන් - විභක්ති - කරණ විභක්ති

2) තත්ත්වය - තද්ධිත - භාවාර්ථය
ද - නිපාත - අනියමාර්ථය
මුහුදු රළ - සමාස - සම්බන්ධ විභක්ති සමාස

3) බුත්සරණ - සන්ධි - ගාත්‍රාදේශ සන්ධි
වැනි - නිපාත - සමාන වාචී නිපාත
සම්පාදනය - උපසර්ග - අර්ථය උසස් කිරීම

4) ගඟගාමීන් - තද්ධිත - ඒ දෙසට යන අරුත දෙන
කරද්දී - ක්‍රියා - කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියා
දැල්වෙනු - කෘදන්ත - කර්මකාරක කෘදන්ත

5) යාවජීව - සමාස - අව්‍ය සමාස
ආධුනිකයින්ට - විභක්ති - සම්ප්‍රදාන
නැඳුන්වා - ක්‍රියා - පූර්ව ක්‍රියා (ලකුණු $\frac{1}{2} \times 6 = 3$)

6) අ) i. ජීවන දෘෂ්ටිය ii. උපයුක්ත
iii. සංගෘහිත iv. පුනර්ජීවනයක්
v. විකාශනයේ vi. තුන් ඇඳුතු

ආ) i. ගිනියම් ii. අම්පාර
iii. නිරවුල් iv. දකුණත
v. රත්මලාන vi. උකුස්සා (ලකුණු $\frac{1}{2} \times 6 = 3$)

ඉ) i. අහෝ ! ඔබ වහන්සේට මේ කිමෙක් වීද ?
ii. කුඩ, කොඩි, සේසත්, දවුල්, හොරණෑ සහිත පෙරහැර 'දේවාල පෙරහැර' ලෙස හැඳින්වේ
iii. රංබරණ : ( විස්මිත්තව කම්පාවෙමින්) ඒ වුණාට හේතුවෝ මම උඹට උගන්නනවනෙ...
(ලකුණු $\frac{1}{2} \times 6 = 3$)

ඊ). i. තමන් හැදට ඉතා ආසන්නයෙන් ගමන් කරන බව අභ්‍යවකාශගාමීහු පැවසූහ.
ii. ඔවුහු දිය නෑමට ගියේදැ? යි දරුවන්ගෙන් ගුරුතුමා විමසුවේය.
iii. තමා වාසනාවන්තයකු බව ගෙතෙම ප්‍රීතියෙන් කීවේය. (ලකුණු $1 \times 3 = 3$)

7) i. උපකල්පනය, පිළියෙල, මනස්, රංගපෑමට, විද්‍යාඥයකු, සාහිත්‍යමය

සා - ඇලපිල්ල
තය -
රු - කෙටි පාපිල්ල
කු - කෙටි පාපිල්ල

හි - කෙටි ඉස්පිල්ල
ක -
ව -

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

ii. ගෘ - ගැටය සහිත ඇලපිල්ල — හ -

නි - කෙටි ඉස්පිල්ල — ඊ -

මා - ඇලපිල්ල — ණා -

iii. තද්ධිත පද 3 - සාහිත්‍යමය, විද්‍යාඥයකු, ධීමත්, ප්‍රාසංගික, ශිල්පියා, හැකියාව, අධ්‍යක්ෂවරයා

iv. ප්‍රාසංගිකව

v. ක්‍රියාවලියක් - ක්‍රියා + ආවලියක් / ක්‍රියාවලි + අක්

ගොඩනැගිල්ලක් - ගොඩනැගිලි + අක්

ගොඩනග + ඉලි + අක්

අධ්‍යක්ෂ - අධි + අක්ෂ

8) වර්ගාක්ෂර

අක්ෂර උත්පත්ති ස්ථාන අනුව අක්ෂර වර්ගීකරණය කර ඇත. ඊට ව්‍යඤ්ජන අක්ෂර 25 අයත් ය. පහත දැක්වෙන්නේ එලෙස උච්චාරණ ඉන්ද්‍රිය අනුව අක්ෂර වර්ග කර ඇති අයුරු ය.

| | | |
|---|---|---|
| 'ක' වර්ගය | - ක ඛ ග ඝ ඞ | ඟ |
| කණ්ඨජ | | |
| 'ච' වර්ගය | - ච ඡ ජ ඣ ඤ | ඦ |
| තාලුජ | | |
| 'ට' වර්ගය | - ට ඨ ඩ ඪ ණ | ඬ |
| මූර්ධජ | | |
| 'ත' වර්ගය | - ත ථ ද ධ න | ඳ |
| දන්තජ | | |
| 'ප' වර්ගය | - ප ඵ බ භ ම | ඹ |
| ඕෂ්ඨජ | | |

සඤ්ඤක අක්ෂර ඇති විට ද ලකුණු පිරිනමන්න.

ii. මිශ්‍ර ක්‍රියා

කර්තෘ අවසාන ක්‍රියාවක් සමඟ කරනු ලබන වෙනත් ක්‍රියා මිශ්‍ර ක්‍රියා නම් වේ. මිශ්‍ර ක්‍රියා සෑදෙන ආකාර 2කි.

1. ක්‍රියාමූලයට 'මින් ප්‍රත්‍යය එක්වීම.

උදා: නට + මින් - නංගී නටමින් ගී ගැයුවා ය.

ක + මින් - අපි කෑම කමින් විනෝද වූයෙමු.

ලිය + මින් - අම්මා මැල්ලුම් ලියමින් දිවා ආහාරය පිළියෙල කළාය.

2. පූර්ව ක්‍රියාව දෙවරක් යෙදීම -

නට නටා - නංගී නට නටා ගී ගැයුවාය.

කකා - අපි කෑම කකා විනෝද වූයෙමු.

ලිය ලියා - අම්මා මැල්ලුම් ලිය ලියා දිවා ආහාරය පිළියෙල කළාය.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

iii. විභක්ති සමාසය

යම් විභක්තියකට අයත් පදයක් වෙනත් පදයක් හා යෙදී කෙටි කර දක්වා ඇත්තේ නම් එය විභක්ති සමාසයයි. ප්‍රථමා හා ආලපන විභක්ති නාම පද සමාස වී නොයෙදේ.

උදා:- කර්ම විභක්ති සමාසය - ගත් කරන්නේ - ගත්කරු

- කම් කරන්නේ - කම්කරු

කර්තෘ විභක්ති සමාසය - වෛයන් විසින් බඳින ගුඹස් - වෛගුඹස්

ගුරුන් විසින් දෙන උපදේශ - ගුරූපදේශ

කරණ විභක්ති සමාසය - රනින් කළ කම් - රන්කම්

අතින් කළ කම් - අත්කම්

සම්ප්‍රදාන විභක්ති සමාසය - වැඩිහිටියන් සඳහා තැනූ නිවාස - වැඩිහිටි නිවාස

දෙවියන්ට කරන පූජා - දේවපූජා

සම්බන්ධ විභක්ති සමාසය - ඇතාගේ දළ - ඇත් දළ

මවගේ ගුණ - මව්ගුණ

අපාදාන විභක්ති සමාසය - අහසෙන් වැටෙන දිය - අහස් දිය

මුහුදෙන් හමන සුළං - මුහුදු සුළං

ආධාර විභක්ති සමාසය - වනයෙහි මල් - වනමල්

පොළෙහි පොල් - පොල්පොල්

iv ගාත්‍රාදේශ සන්ධිය

සන්ධි වන පද දෙකෙන් පෙර පදයේ අග හෝ පසු පදයේ මුල ඇති ගාත්‍රාක්ෂරය වෙනුවට අලුතෙන්ම ගාත්‍රාක්ෂරයක් පැමිණ ගැලපීමෙන් මෙම සන්ධිය සෑදේ.

උදා:- ගිනි + කම්
ය්
ගිනි + ~~ක්~~ + අම්
ගිනියම්

සැරි + පුත්
ය්
සැරි + ~~ප්~~ + උත්
සැරියුත්

ණ්
~~පඩ්~~ + ඩිය
පන්ඩිය

v. කරණ කාරක කෘදන්ත

කරණාර්ථයක් හඟවන '' න'' ''නා'' ප්‍රත්‍යය යෙදී කරණකාරක කෘදන්ත සෑදේ.

න - බල + න = දුරබලනය

= දියකඩනය

= දුරබණනය

නා - බස් + නා = දිය බස්නාව

= අත් පිස්නාව

(ලකුණු 5×3 = 15)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

# පෙරහුරු පරීක්ෂණය - 2026

## 13 ශ්‍රේණිය

## i ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු පත්‍රය.

1. අ. i. බුදුහිමි වඩින බව කියා පෑමට නියම වූ පුද්ගලයෙකු÷ගේ කාර්ය ඉටු කරන්නෙකු මෙනි.

ii. මට්ටකුණ්ඩලී හට බොහෝ ප්‍රයෝජන ඇති වන නිසා.

iii. ලාකඩ කැටියක ඇති වූ පබළු ගසේ ළපටි දළුකොළ නොහොත් ලා කඩ දිමියෝ ගිල්වා.

iv. දෙදණ සහ පොකණිය ත්‍රිමණ්ඩලයයි. භික්ෂූන් වහන්සේ නමක් චීවරය ඇඳිය යුත්තේ එම ස්ථාන වැසෙන පරිද්දෙ.

ආ. i. ජීවක දෙස බලා දොහොත් මුදුන් තබා වඳිමින්.

ii. තම දිවි රැක දෙන ලෙස.

iii. ඔහු සනසා ඇතින් නෙල්ලි ගෙඩියක් ගෙන අතින් තිය කොළවරින් බෙහෙතක් ඔබා.

iv. උකුණු බිත්තර වන ළේවියකවත්.

ඉ. i. කටින් අල්ලාගෙන ආ මස් කෑටිය දමා මාළුවට යමි'යි අල්ලා ගන්නට ගිය විට මස් කුට්ටිය උකුස්සා ගත්තේය.මාළුවා දියට පැන්නේය. මෙම සිදුවීම දැක.

ii. පතිවත ඇත්තියගේ ධර්මය රැකීම මිස මෙවැනි නොකළයුත්තක් නො කරන්න.

iii. පළමුව උයවාගෙන අනුභව කළ ස්වාමියා නැතිව අලුත් ස්වාමියාත් නැතිව දෙදෙනාගෙන් ම පිරිහුණු ව සිටිනා ඔබ.

iv. ආශාව ඇති/ බලාපොරොත්තුව ඇති.

ඊ. i. බඳපුටුවක පළසක් මත සිටියේ ය.

ii. නිරුවැරැස් කලඹක් ලෙස.

iii. සුදුපාට රශ්මියෙන් වෙනස් වූ පාට ඇති, ඉතා රතු තොල් දෙක සොලවා

iv. බඳ පුටුව හෙවත් සිංහාසනය

උ. සද්ධර්ම රත්නාවලියේ එන

i. මට්ටකුණ්ඩලී කතා වස්තුවේ අදින්න පුබ්බක විසින් මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයාට අදින්න පුබ්බක හඬන අවස්ථාවේ මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා දුන් උපදෙසට ප්‍රති උත්තර දෙන අවස්ථාවේ.

ii. පූජාවලියේ ජීවක කතා වස්තුවේ එන බරණැස් සිටුතුමා ජීවක වෛද්‍යවරයාට මත්ථලුංගෙ ශෝධක ආනුවන් කළ රෝගයෙන් පෙළෙන සිටුවරයාට ජීවක වෛද්‍යවරයා ප්‍රතිකාර කරන්න ගිය අවස්ථාවේ.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

iii. පන්සිය පනස් ජාතක කතා පොතේ එන චන්ද කින්නර ජාතකයේ බරණැස් රජු විසින් චන්ද්‍රිකා කින්නරාවගෙන් අසන ලදී. ඇය කිඳුරු විසංඥව වැටී සිටි අයුරු දැක හඬන අවස්ථාවේ.

iv. සද්ධර්මාලංකාරයේ එන නන්දිවාණිජ වස්තුවේ නන්දිය වෙළෙන්දාගේ බිරිඳ විසින් ඇයට යෝජනාව ගෙන ආ කෙල්ලට ; කෙල්ල විසින් සිව අමාත්‍යවරයාගේ යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේ.

v. සයිමන් නවගත්තේගමගේ භාවනා කෙටි කතා සංග්‍රහයේ එන ස්නේහය කෙටි කතාවේ කළු බංඩි මුදලාලිගේ මැණිකේ විසින් පිංචි මහයියාට, පිංචි මහයියා වතුර ගෙන ඒමට වැවට ගිය අවස්ථාවේ.

vi. එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ පේමතී ජායති සෝකෝ නාට්‍යයේ 3 වන අංකයේ ස්වර්ණතිලක විසින් ශිෂ්‍යයන්ට, ශිෂ්‍යයන් විසින් ඈතා බලන්නට යෑමට කතා කළ අවස්ථාවේ.

vii. ලෙනාඩ් වුල්ෆ් රචිත ඒ. පි. ගුණරත්නයන් අනුවර්තනය කරන ලද බැද්දේගම නව කතාවේ බබේහාමි ආරච්චිල විසින් සිලිඳුට, ආරච්චි හේන පෙන්වන්නට සිලිඳු හා යන අවස්ථාවේ. (ලකුණු 3× 4)

පොත හා කර්තෘවරයාට - ලකුණු 01

කවුරුන් විසින් කා හට - ලකුණු 01

අවස්ථාව - ලකුණු 01

ඒ) රසාස්වාදයට ලකුණු ප්‍රදානයේදී පද්‍ය පන්තිය සමස්තයක් ලෙස ගෙන භාෂා ලක්ෂණ ආදිය ගැන ලියා ඇත්නම් ඉහළ ලකුණක් ප්‍රදානය කරන්න. කවිය ලියා තේරුම ලියා ඇති විට ප්‍රදානය කළ හැකි උපරිම ලකුණු 6 කට අඩු බව සලකන්න. (ලකුණු 12)

පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ පොඩි මල්ලිගේ කාව්‍ය සංග්‍රහයෙන් උපුටාගෙන ඇත. වේදනාබර සමුගැනීමක් අන්දැකීම වී ඇත.

* වියෝගය අමෙව්ර ස්වභාවයෙන් නිරූපණය කර ඇත.

* ජීවිතය පුරා තමාට වැරදුණු තැන් මෙනෙහි කරයි.

* තම සතුට සහමුලින්ම ගෙන යන ලෙස පවසයි. එහෙත් සතුට උදා කරන අවංක සිත තමා සතු බව පවසයි.

* කවියා උපේක්ෂා සහගත වෙයි.

* රූපක භාවිතය තුළින් විවිධ ධ්වනිතාර්ථ මවයි.

උදා:- මහද තෙත් වැහි වලාකුළ අරන්
මා හදේ පිපුණු මල්
ඔබේ රථ මැදිරියට මගේ ඉර හඳ අරන්
ගෙවදින්න ඇති නිසා හෙට අලුත් විමානෙට

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

* සංකේත ව්‍යංගාර්ථ දනවයි.
    * ''සුරලා ගෙන යන්න මා හදේ පිපුණු මල් ''
    * ''පෙම් ගී අලංකාර වීසි කොට යනු මැනවි ''
    * '' හෙමෙන් මා අත අතහැර ''
    * '' ආදරය නින්දක් ද පිබිදිලා සිටින මට''
    * ''වෙස් මුහුණු පැලඳ ගෙන සිටින තැන හිතක් නැත.''
* සහෘදයා උසස් චින්තනයක් කරා ගෙන යයි.
* කට වහරට සමීප භාෂාවක් යොදයි.
* සංකල්ප රූප මැවේ.
* සැහැලි ආකෘතිය අතරට සිව්පද ආකෘතිය යොදාගෙන ඇත.

ජීවන දෘෂ්ටිය - ශවර බැඳීමක් අහිමි වුව ද උපේක්ෂාව හා අකම්පිත බව පෙරදැරි කරගෙන ජීවත් වීමට හුරු පුරුදු විය යුතු ය.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources